# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.01 පැය 1445 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/03/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

## 01. ගිනි තබා දැරිය ඝාතනය කර මව සිය දිවි නසා ගැනීමක් - තලාව පොලිස් වසම.

2024.12.30 වන දින සවස් කාලයේ තලාව පොලිස් වසමේ බිදුන්කඩ ප්‍රදේශයේදී කාන්තාවක් විසින් තම කුඩා දැරියට පෙට්‍රල් දමා ගිනි තබා ඝාතනය කර ඇයද පෙට්‍රල් දමාගෙන ගිනි තබා ගෙන සිය දිවි නසා ගෙන ඇති බවට 2024.12.31 වන දින තලාව පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 39 ක් හා මියගිය දැරිය වයස අවුරුදු 02 මාස 09 ක් වූ බිදුන්කඩ, හිදෝගම ප්‍රදේශයේ පදිංචිකාරියන් වේ.**

මරණකාරිය ඉහත ප්‍රදේශයේ කාන්තා සමිතියක භාණ්ඩාගාරික වශයෙන් කටයුතු කර ඇති බවත්, එහිදී ඇති වූ මුදල් ගැටළුවක් මත සිත් තැවුලෙන් දැරිය ඝාතනය කර ඇය සිය දිවි නසා ගෙන ඇති බවට සැකකරන බවට ඇගේ ස්වාමි පුරුෂයා විසින් පොලිසියට කරන ලද පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෘත ශරීර අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. දියේ ගිලී මියයාමක් - වැලිකන්ද පොලිස් වසම.

2025.01.01 වන අද දින අළුයම් කාලයේ වැලිකන්ද පොලිස් වසමේ ගිනි දමන ප්‍රදේශයේදී යතුරු පැදියකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකු ඇලට වැටී දියේ ගිලී මියගොස් ඇති බවට වැලිකන්ද පොලිසියට ලද පැමිණිල්ලක් අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ ගිනිදමන, නෙළුම්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සෙත් පිරිත් වැඩසටහනකට සහභාගී වී යතුරු පැදියෙන් නිවසට පැමිණෙමින් සිටියදී මෙම අනතුරට මුහුණ පා ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය වැලිකන්ද රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**